බණ්ඩාරනායක මහතා මරා දැමුවේ ජේවීපිය වත් කොටි සංවිධානය වත් නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේම අය යයි ඔහු කීවේය. සෙල්ලම කොතරම් භයානකද යන්න එයින් පෙනේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමේ බහුතරයේ කැරැට්ටුව රටේ බුද්ධිමත් ජනතාව හොඳින් වටහා ගෙන සිටින බව අපි දනිමු. එසේම බලයටම ඉව අල්ලාගෙන ජනතාව ගැන බෙරිහන්දෙන සමහර යූ. ඇන්. පීකාරයන් ගැනද ජනතාව දනිති. බොරු සිංහල බෞද්ධකම බොරු ජනතාවාදීකම, බොරු දේශප්‍රේමය මේ දෙගොල්ලන්ගේම පිරුවටයයි. එහෙයින් ජාතික සමගිය සම්බන්ධයෙන් මෛත්‍රීගේ ආකල්පය මොවුන් ඉවසා සිටින්නේ අමාරුවෙනි. මෛත්‍රීගේ දේශපාලන සදාචාරය ද මේ දෙගොල්ලන්ටම අල්ලන්නේ නැත. යහපත් සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් අත්‍යවශ්‍ය සදාචාර සම්පන්න දේශපාලන චර්යාවන් මොවුන්ගෙන් අපේක්ෂා කළ නොහැක. මොවුන් කාගේත් න්‍යාය වන්නේ කල දුටු කල වළ ඉහගැනීමයි.

රටට කිසිඳු ප්‍රයෝජනයක් නැති රාජපක්ෂ කාබාසිනියා සංවර්ධන ව්‍යපෘති තවත් උගුලකි. ඒවායින් ලොකුම උගුල වන්නේ පොට් සිටි ව්‍යපෘතියයි. රටට යාකර මුහුද ගොඩකර හදන මේ දූපතෙන් කොටසක් සින්නක්රයටද කොටසක් 99 අවුරුද බදු වශයෙන්ද චීනයට ලියා දෙමින් රාජපක්ෂලා කර ඇති මේ මහා පාවාදීමෙන් රට මහා අනතුරක හෙළා ඇත. ලෝකයේ බලගතු රටක් සමග ආරවුලක නොපැටලී මෙය බේරා ගත යුතුව තිබේ. එ සේ ම හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ වැනි අති දැවැන්ත සුදු අලින්ට කරන්නේ කුමක්ද යන්නද ගැටලුවකි. රටේ ආර්ථිකය විනාශ මුඛයට ඇදදැමූ මේ ව්‍යපෘති සමග මිහින් එයාර් වැනි මහජන මුදල් කන මකර කටවල් ද රාජපක්ෂ රටේ ආර්ථිකයට ඇටවූ උගුල්ය. මේ සියල්ල නිවටයන් සේ අනුමත කළ වුන් දැන් කූඩැල්ලන් වී මෛත්‍රී පාලනයේ එල්ලී සිටිති. දැවැන්ත නාස්ති සම්බන්ධයෙන් වන වගකීමෙන් ඔවුන් දැන් නිදහස් වී සිටින සෙයකි.

මේ උගුල්වලින් රට ගලවාගෙන තමාත් ගැලවී ජනතා අපේක්ෂා ඉටුකරන්නට මෛත්‍රීට ශක්තිය දෙන්නේ කවුද යන්න වර්තමානයේ ඇති ලොකුම ගැටලුවයි. ඒ ශක්තිය මෛත්‍රී ලබා ගත යුත්තේ දෙළ පිදේනි අපේක්ෂා නොකරන සිවිල් සමාජයෙනි. ජනාධිපතිවරණයේදී තමා සමග සිටි උගතුන් බුද්ධිමතුන් කලාකරුවන් පෙරටුකරගත් සිවිල් සමාජ සංවිධානවලිනි.

ඒ සිවිල් පුරවැසියන්ද සටන තවමත් අවසන් නැති බව වටහා ගනිමින් සංවිධිතව පෙරට ආ යුතුව තිබේ. එසේ නොවන්නේ නම් මහින්ද පෙරට ගෙන යළිත් මේ රට ජාතිවාදයෙන් මුසපත් කරවා විනාශය කටින්නට අවස්ථාවාදීන්ට අවස්ථාව ලැබෙනු ඇත.

# ප්‍රහෙළිකාව සාර්ථකව සම්පූර්ණ කරගන්න.

අපේ අනාගතය ගැන - ඉරණම ගැන - දෛවය ගැන, අපේ තියෙන පිලිගැනීම එකිනෙකට වෙනස්. එය දැනටමත්, සකස් වී, සහතික වී ඇති දෙයක් බව කෙනෙකු විශ්වාස කරන විට, සමහර අයෙකුගේ විශ්වාසය එය අප විසින්ම සකස් කර ගත යුත්තක් බවයි.

ඒ විශ්වාසය කුමක් වුනත්, ඒ සියලු විශ්වාසයන්ට පොදු වූ ගුණාංගයක්, පිලිගැනීමක් අප අවබෝධ කරගත යුතු වෙනවා.

එනම්, ඔබ අද ලබන අත්දැකීම් සහ ඔබ මුහුන දෙන සිද්ධීන් හරහා ඔබගේ එම අනාගතය ගොඩනැගෙමින් පවතින බවයි. මෙම ගමනේදී ඔබට මුහුන දීමට සිදුවන සමහර අත්දැකීම්, ඉතා මිහිරි, සාර්ථක ඒවා වේවි. ඒ වගේම ඉතා අසාර්ථක වූ, අමිහිරි වූ අත්දැකිමුත්, ඒ අතර තිබේවි. මොන විදියේ අත්දැකීමක් වුනත්, ඒ සෑම අත්දැකීමක්ම ඔබේ අනාගතයේ - ඉරණමේ - දෛවයේ, සම්පූර්ණ ප්‍රෙහෙලිකාව නිමකිරීමට අවශ්‍ය එක ප්‍රෙහෙලිකා කොටුවක් පමනක් බව සිහිතබා ගත යුතුය.

සෑම සාර්ථක පුද්ගලයෙකුගේම ජීවිත කථාවේ අසාර්ථක වීම, පසුබෑම්, බිඳවැටීම් දකින්නට ලැබෙනවා. එම සිද්ධීන්ට මුහුන දෙන අවස්ථාවේ නම් ඒවා දරාගැනීමට ඔවුනට අපහසු වෙන්නට ඇති. නමුත් ඒ සෑම සිද්ධියක්ම ඔවුන්ගේ ප්‍රෙහෙලිකාවේ තවත් එක කොටුවක් පමණක් නිසාත්, එම සෑම කොටුවකම දායකත්වය අවසාන නිර්මාණය සාර්ථක කරගැනීමට ඔවුන් උපයෝගී කරගත් නිසාත්, ඔවුන්ගේ ජීවිත ජයග්‍රාහී - සාර්ථක ජීවිත බවට පත්වෙන්නට ඇති.

යම් සිදුවීමක්, අවස්ථාවක් දිහා පැතිකඩ කිහිපයක් ඔස්සේ අපට බලන්න පුලුවන්. ඒ බලන හැම පැතිකඩයක්ම සාධාරණීකරනය කිරීමට අවශ්‍ය කරුණු ද අපට යොහාගන්න පුලුවන්.

උදාහරණයක් ලෙසට ඔබ දවසම ගොඩක් මහන්සි වෙලා හවස ගෙදර එනවා. ඔබ එන්නේ ටිකක් විවේකීව, රූපවාහිනිය බලලා, ගෙදර අයත් එක්ක සතුටු සමචිජයේ යෙදිලා, පොතක් පතක් බලලා නිදහස් වෙන්න. හැබැයි ගෙදර එනකොට ඔබට පෙනෙනවා ඒ පැත්තෙම විදුලිය විසන්දි වෙලා. සැලසුම් කරගෙන ආපු කිසිම දෙයක් කරගන්න බැරිවෙනවා. මොකද ඔබ කරන්නේ? ඔබට හරියට තරහා හිතෙනවා ආපු වැඩ කරගන්න බැරිවීම ගැන. ඇගේ මහන්සියයි, තරහයි එකතුවුනාම, හැමදේම එපා වෙනවා. ඒ වෙලාවට ගෙදර දරුවන් - බිරිඳ - ස්වාමියා - දෙමාපියන් කරන දේවල් ඔබට පෙනෙන්නේ මහා කරදරයක් විදියට. ඒ වෙලාවට ගෙදරින් පටන් අරගෙන, අසල්වාසීන්ට, නගර සභාවට - ගමට - රටට ඔක්කොටම බැනලා, ඒ බැනීම නිසා තවත් කලකිරීමට පත්වෙලා නින්දට යනවා. ඒ තරහින් නිදාගන්න ඔබ පහුවෙනිදා නැගිටින්නේ දැඩි වෙහෙසකින්මය.

එහෙම නැත්නම් ගෙදර තියෙන ඉටිපන්දමක්, ලාම්පුවක් පත්තුකරගෙන අත්‍යවශ්‍යම වැඩ ටික නිමාකරන ඔබ, ගෙදර අයත් සමඟ ගෙදර ආලින්දයට, මිදුලට ඇවිල්ලා සතුටු සාමිචියේ යෙදෙන්න මේක හොඳ අවස්ථාවක් කරගන්නවා. හැම දෙනාත් එක්කම බොහොම සතුටු වෙලා, විහිළු තහලු කරලා, විනෝද වෙලා නින්දට යනකොට ඔබට හිතේවි අද රාත්‍රියේ අපේ පවුලේ අය කොච්චර සතුටෙන් එකිනෙකාට සමීපව කාලය ගතකලාද කියලා.

මේ දෙආකාරයට ඇර, තවත් ඕනෑම ආකාරයකට ඔබට මෙම සිද්ධිය දෙස බලන්න පුලුවන්. ඔබ ඒ බලන විදියට තමයි ඔබගේ ඊලඟ පියවර තීරණය වන්නේ.



ඒ නිසා ඔබ මතකතබා ගතයුත්තේ අද මේ මොහතේ ඔබ මුහුණ දෙන අත්දැකීම් අමිහිරි - අසුභ - අසතුටු දායක අත්දැකීමක් නම් එය තවත් එක සිද්ධියක් හෝ අත්දැකීමක් මිසත් නිමාව එය නොවන බවයි. ඒ නිසා එම අත්දැකීමට ධෛර්යයෙන් යුතුව මුහුන දෙන්න. එයින් ලැබෙන පනි විඩයට ඇහුම්කන් දෙන්න. ඉදිරියටම යන්න. ජීවිතය සාර්ථක කරගන්න.

**නුවන් සමරපති**
පුද්ගල සංවර්ධන පුහුණුකරු
කතෘ - U Turn- ග්‍රන්ථය
Master Practitioner NLP- (USA)
Bachelor of Commerce - Marketing -( AUS)
Master Practitioner Hypnotherapy –(USA)
DIP in Sports Psychology - (UK)
0450 265 167
nuwancsan@gmail.com

ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises
**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY
LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au